# බුදු පිළිමයේ ආරම්භය පිළිබඳ අධ්‍යයනයක්

M.A.I.U.වීජේතිලක*

ත්‍රිවිධ චෛත්‍ය අතර උද්දේසික චෛත්‍ය වශයෙන් සළකනු ලබන බුද්ධ ප්‍රතිමා බෙහෙවින් ජනප්‍රිය කලාකෘතියක් බවට පත් වූයේ බුද්ධ පරිනිර්වාණයෙන් සියවස් පහකට පමණ පසුවය. මුල් යුගයේදී ප්‍රතිපත්ති පූජාවට තැන ලැබීම නිසාත් බුදුරදුන් ජීවමානව වැඩ සිටීම නිසාත් බුදු පිළිමවල අවශ්‍යතාවක් නොවීය. බ්‍රහ්මජාල සූත්‍රය මෙම කරුණ සනාථ කරයි. පැරණි කලාකරුවා බුදු පිළිම නෙළීමට අපොහොසත් වූවා නොව ඔහුට එසේ කිරීමේ උවමනාවක් නොවීය. පසුව ආමිස පූජාවට තැන ලැබීමත් සමග බුදුරදුන් වෙනුවට උන්වහන්සේගේ ස්වරූපය විදහා දැක්වෙන බුදු පිළිම නෙළිමට පෙළඹී ඇත. මුල් අවධියේ බුදුරදුන් වෙනුවට සංකේත යොදාගත් අතර ඒ අතුරින් ශ්‍රී පතුල, ධර්ම චක්‍රය, ස්තූපය, බෝධිය, රුස්වළල්ල, වජ්‍රාසනය සහ ශ්‍රී හස්තය ආදී සංකේත යෙදූහ. මෙම කරුණ භාරුත් හා සාංචි කැටයම් තුළින් පැහැදිලිව හඳුනාගත හැකිය.

ප්‍රථම වරට බුදු පිළිම නෙළන ලද්දේ කවර කලෙක කවරෙකු විසින්ද යන්න විවාදයට තුඩුදුන් කරුණකි. ඒ පිළිබඳව විවිධ මත දැක්වෙයි. එබඳු මත අතර කොසොල් රජතුමා බව, ලාංකික කලාකරුවන් බව, ගන්ධාර කලාකරුවන් බව, මථුරා කලාකරුවන් බව, ගන්ධාර හා මථුරා කලාකරුවන් බව මුළික වෙයි. පාහියන් වාර්තා අනුව කොසොල් රජු බුදුරදුන්ගේ ප්‍රමාණයට සඳුන් ලීයෙන් පිළිරුවක් අඹවන ලද බව පෙනේ. 'කෝසල බිම්බවණ්ණනා' නම් පසු කාලයේ ලියන ලද පාළි පොතක ඒ ගැන කියවෙයි. දෙවනපෑතිස් රජු විසින් ශිලාමය බුද්ධ ප්‍රතිමාවක් ථූපාරාමයේ පිහිටවූ බව මහා වංසයේ සඳහන් වෙයි. එතැන් සිට රජවරු ගනණාවක් එම පිළිමයට දක්වන ලද පුද පූජාදිය පිළිබඳව සඳහන් වෙයි. 4 වන මිහිඳු රජුගේ සෙල්ලිපියේ මගුල් මහසල පිළිමය යන සඳහන තුළින් තවදුරටත් එම බුදුරුව ගැන කියවෙයි. එම පුවත අනුව ප්‍රථම වරට බුදු පිළිමය නෙළිමේ ගෞරවය ලක්දිව කලාකරුවන්ට හිමිවනු ඇත.

දැනට සොයාගෙන ඇති පුරාවිද්‍යාත්මක සාධක අනුව පැරණිම බුදුරුවක සටහන් හමුවන්නේ ගන්ධාරයෙනි. කණිෂ්ක රාජ්‍ය සමයේ (ක්‍රි:ව 78-144) කාසියක එක් පැත්තක බුද්ධ රූපයක් දැක්වෙයි. ඒ අනුව ගන්ධාර කලාකරුවන් විසින් ප්‍රථම වරට බුදු පිළිමය නෙළන ලද බව තවත් මතයකි. ඔවුන් ග්‍රීක ඇපලෝ දෙවියන්ගේ රුවට සමාන ආකාරයෙන් පිළිම නෙළන ලද අතර බුදුරදුන්ගේ විශේෂ ලක්ෂණ ඉස්මතුකර පෙන්වීමට යත්න දරා ඇත. මථුරාවේ කලාකරුවන්ද මෙම යුගයේම බුදු පිළිම නෙළීමට පෙළඹී ඇති බව තවත් අදහසකි. ඒ අනුව ගන්ධාර, මථුරා පළාත් දෙකෙහිම එකම යුගයක පිළිම නෙළීම සිදුවූ බව වාර්තාවෙයි. පසුකාලයේ දී ගන්ධාර හා මථුරා යන සම්ප්‍රදාය දෙකෙහි එකතුවෙන් ආන්ද්‍රා සම්ප්‍රදාය නමින් නවතම සම්ප්‍රදායක් බිහිවිය. මෙසේ විවිධ සම්ප්‍රදාය ඇසුරින් බුද්ධ ප්‍රතිමා බිහිවී ඇත.

ප්‍රමුඛ පද - ප්‍රතිමා, ගන්ධාර, මථුරා, පුරාවිද්‍යාත්මක, ශිලාමය

* පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය